රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.10.10

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කර්තෘ,

## <u>ගම්පහ දිස්ත්‍රික්කයේ කොවිඩ් 19හා සම්බන්ධ නව තත්ත්වය පිළිබඳව ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා විසින් කරුණු පැහැදිළි කිරීම</u>

ගම්පහ දිස්ත්‍රික්කයේ කොවිඩ් 19 හා සම්බන්ධ නව තත්ත්වය පිළිබඳව අද දින (10.10.2020) ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා විසින් කරුණු පැහැදිළි කරන ලදී. එහිදී ප්‍රකාශ කරන ලද කරුණු පහත පරිදි වේ.

පවත්නා තත්ත්වය තුළ මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ක් හැර සෙසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 හි නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක කොට ඇත. ඒ හැර සෞඛ්‍ය අංශයන්හි මැදිහත්වීමෙන් රෝගීන් හඳුනාගැනීම, සෞඛ්‍ය පහසුකම් ලබා දීම, නිරෝධායන මධ්‍යස්ථාන කරා තැනැත්තන් ගෙන යාම වැනි කටයුතු මේ වන විටත් සිදු කෙරේ. අද වන විට වාර්තා වී ඇති ආකාරයට, **PCR** පරීක්ෂණ 5357 ක් සිදු කර ඇති අතර, ඉන් 970 ක් රෝගය ආසාදිත බවට වාර්තා වී ඇත.1770 ක ප්‍රතිඵල වාර්තා වීමට නියමිත බවත් 2593 ක් ආසාදිත නොවන බවට හඳුනාගෙන තිබෙන බවත් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා තිබේ.

මෙහිදී, බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවයේ නියුතු තැනැත්තන් 119 ක් පිළිබඳව විශේෂයෙන් සොයා බැලීමට සිදුවී ඇති අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා සහ ආරක්ෂක අංශයේ මැදිහත්වීමෙන් ඒ සඳහා විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කෙරේ. මෙම සංඛ්‍යාව ඊයේ වන විට 250 ක පමණ අගයක් ගත්තද මේ වන විට අඩු කර ගැනීමට හැකි වී ඇත. මෙම පිරිස් හඳුනාගෙන නිරෝධායනය හෝ සෞඛ්‍ය ආයතන කරා යොමු කිරීමට හැකි වූවිට ගම්පහ දිස්ත්‍රික්කය තුළ මෙම තත්ත්වය පාලනය කළ හැකි බව විශ්වාස කළ හැකිය. මෙහිදී, සෞඛ්‍ය හා පරිපාලන අංශ මෙන්ම ආරක්ෂක අංශ ඉතාමත් සක්‍රියව මෙම උද්ගත වී ඇති තත්ත්වය පාලනය කළමනාකරණයට දායක වී සිටිති.

අත්‍යවශ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් ගත් විට, ජනාධිපති ලේකම් වරයාගේ උපදෙස් පරිදි ජනතාවට අපහසුතාවක් ඇති නොවන පරිදි සැපයුම් ජාලයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබේ. ඒ අනුව ඊයේ සහ අද දිනයන්හි අත්‍යවශ්‍ය සේවා හා විශේෂයෙන් ඖෂධ ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. යම් කෙනෙකුට තමාට ඉතාම සමීප වෙළඳසැල

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவெனியூ, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk

හෝ ෆාමසි වෙත පැමිණ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා ඖෂධ ලබා ගැනීමට හැකියාව තිබේ. මෙහිදී, දුරබැහැර පිහිටි ගම්මාන වෙත, විශේෂයෙන්ම මිනුවන්ගොඩ හා දිවුලපිටියට විවිධ අංශයන්හි සහභාගිත්වයෙන් සතොස හා පිළිගත් වෙළඳ ආයතන හරහා සැපයුම් ජාලයක් ක්‍රියාත්මක වේ. ගෘහස්ත මට්ටමින් ස්වයං නිරෝධායනයට ලක් කෙරෙන පිරිස් සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය අරමුදල් මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී ඇත.

හෙට දිනයේ පැවැත්වෙන 5 වසර ශිෂ්‍යත්ව විභාගය හා සඳුදා ඇරඹෙන උසස් පෙළ විභාගය සම්බන්ධයෙන් ගත් විට, ඒ සඳහා විශේෂිත වැඩසටහන් අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් සම්පාදනය කර තිබේ. මෙහිදී, නිරෝධායන මධ්‍යස්ථාන වල සම්බන්ධීකරණ කටයුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මගින් සිදු කෙරෙන අතර, යම් අවශ්‍යතා මතු වුවහොත් අදාළ වසම් භාර ග්‍රාමනිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට නියමිතය.

මෙම තත්ත්වය තුළ අප ප්‍රමුඛතාවය ලබා දී ඇත්තේ, පළමුකොටම කොවිඩ් 19 වෛරසය ආසාදිතවූවන් හඳුනාගැනීමට හා එම බලපෑමට ලක් වූ තැනැත්තන් නිරෝධායන මධ්‍යස්ථාන කරා යොමු කර ඒ තුළින් වෛරසය සමාජගත වීම වැළැක්වීමටයි. දෙවනුව අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම අපගේ ප්‍රධාන කාර්යය භාරය වේ. ඊට අමතරව, ළමා නිවාස, වැඩිහිටි නිවාස, පිරිවෙන් වැනි ස්ථාන වලට අවශ්‍ය පහසුකම් සලසන ලෙස අප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත දැනුම් දී තිබේ. මෙහිදී, යම් අයකුට කිසියම් හෝ ගැටලුවක් වේ නම් වසම් භාර ග්‍රාම නිලධාරි ඇමතිය හැකිය. එමෙන්ම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පැය 24 පුරා විවෘතව පවතී. ඊට අමතරව, සෞඛ්‍ය නිලධාරි කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයද මේ සඳහා විවෘතව පවතී. යම් අයකුට විශේෂ ගැටලුවක් තිබේ නම් මෙම ස්ථාන අමතා අදාළ පහසුකම් සලසා ගැනීම සඳහා සහන යාන්ත්‍රණයක් සකස් කර තිබේ. ඒ අනුව, මෙම තත්ත්වයෙන් ඉතා ඉක්මනින් ගම්පහ දිස්ත්‍රික්කය ගළවා ගත හැකි බව අපගේ විශ්වාසයයි.